## "ගුරු හා විදුහල්පති ඇගයීම 2019" වැඩසටහනට අදාළ උපදෙස්

# 1. ප්‍රණාමලාභීන්

- ගුරුවරුන්
- විදුහල්පතිවරුන්

# 2. ගුරුවරුන් තෝරා ගැනීම.

**2.1** තෝරා ගැනීම සඳහා මූලික සුදුසුකම්

- ශ්‍රී ලංකා ගුරු සේවයේ ස්ථිර පත්වීමක් ලද ගුරුවරයෙකු වීම
- ඇගයීම් පත්‍රය භාරගන්නා අවසාන දිනට අවම වශයෙන් වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා සේවය ස්ථිර කර තිබීම හෝ ඊට අදාළ කටයුතු සිදුකර තිබීම.
- පාසල තුළ සක්‍රීය ලෙස අධ්‍යයන ක්‍රියාවලියට සම්බන්ධව සේවය කිරීම (වෙනත් සේවයකට අනුයුක්තව නොසිටීම)
- ඇගයීම් සඳහා සලකා බලන වර්ෂය තුළ වැටුප් රහිත නිවාඩු ලබා නොතිබීම
- ඇගයීම් පත්‍ර ඉදිරිපත් කරන වර්ෂයෙහි ජනවාරි 01 වන දිනට වර්තමාන සේවය කරන පාසලේ අඛණ්ඩව වර්ෂයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. ඇගයීම සිදු කරන වර්ෂයේ පළමු වාරය තුළ පාසලට ස්ථාන මාරුවක් ලැබී ඇත්නම් පෙර සේවා ස්ථානයෙන් අයදුම් කළ හැකි අතර එම පාසලේ විදුහල්පති විසින් සහතික කළ යුතුය.

**2.2** එක් පළාතකින් ගුරුවරුන් ප්‍රණාමලාභීන් ලෙස තෝරාගන්නා කාණ්ඩ හා සංඛ්‍යා

| පාසල් වර්ගය | අංශ අනුව තෝරා ගන්නා සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | **1-5** ශ්‍රේණි | **6 -9** ශ්‍රේණි | **10 -11** ශ්‍රේණි | **12 - 13** ශ්‍රේණි |
| 1AB | 3 | 3 | 3 | 3 |
| 1C | 3 | 3 | 3 | 3 |
| 2 | 3 | 3 | 3 | - |
| 3 | 3 | - | - | - |
| එකතුව | 12 | 09 | 09 | 06 |

**2.3** සැලකිය යුතු කරුණු

- ✓ ඉහත මූලික සුදුසුකම් සහිත සෑම ගුරුවරයෙකුම මේ සමග ඇති ඇගයීම් පත්‍රිකාව (ආකෘතිය -A) සම්පූර්ණ කර විදුහල්පති වෙත ඉදිරිපත් කළ යුතුය
- ✓ විශේෂයෙන් සඳහන් කර නොමැති අවස්ථාවල දී පෙර වර්ෂයේ 2018 ජනවාරි 01 වනදා සිට දෙසැම්බර් 31 වනදා දක්වා කාලය තුළ තොරතුරු ඇතුළත් කළ යුතුය
- ✓ එක් ගුරුවරයෙකුට ඉදිරිපත් විය හැක්කේ 2.2 හි සඳහන් එක් අංශයක් සඳහා පමණි.
- ✓ 2.2 හි සඳහන් පරිදි එක් පළාතකින් පාසල් වර්ග හා අංශ නියෝජනය කරමින් වැඩිම ලකුණු ලබාගත් ප්‍රණාමලාභීන් 36 දෙනා ජාතික මට්ටමින් ඇගයීමට ලක්කෙරෙන අතර ලකුණු අනුව තෝරා ගන්නා සෙසු ප්‍රණාමලාභීන් පළාත් මට්ටමින් ඇගයීමට ලක්කෙරේ.

.

## 2.4 ගුරුවරුන් ප්‍රණාමලාභීන් ලෙස තෝරාගැනීමේ දී පාසල්, කලාප, පළාත් හා අමාත්‍යාංශ මට්ටමේ කාර්යභාරය

| | |
|---|---|
| පාසල් මට්ටම | • ආකෘතිය - A අනුව සම්පූර්ණ කරන ලද ඇගයීම් පත්‍රිකා ජූනි 15 වන දිනට පෙර සියලුම ගුරුවරුන්ගෙන් ලබා ගැනීම විදුහල්පතිවරයාගේ වගකීම වේ.<br><br>• ගුරුවරුන් විසින් සම්පූර්ණ කරන ලද තොරතුරු හා ලකුණු තහවුරු කිරීම පහත සඳහන් පරිදි පත්කරගන්නා ලද <u>පාසල් ගුරු ඇගයීම් කමිටුව</u> විසින් සිදුකළ යුතුය.<br>▪ සභාපති - විදුහල්පති<br>▪ සාමාජික 1 - නියෝජ්‍ය විදුහල්පති<br>▪ සාමාජික 2 –නියෝජ්‍ය විදුහල්පති/සහකාර විදුහල්පති<br>නියෝජ්‍ය සහකාර විදුහල්පතිවරුන් නොමැති අවස්ථාවල දී (අදාළ ගුරුවරයා ඉල්ලුම් කර ඇති අංශ හෝ ශ්‍රේණි කාණ්ඩයට අදාළ නොවන) පාසලේ වෙනත් ජ්‍යෙෂ්ඨ ගුරුභවතෙකු කමිටුව සඳහා පත් කළ හැකිය. තිදෙනෙකුගෙන් යුත්ක කමිටුවක් පත් කිරීමට අපහසු වන පාසල් කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂගේ උපදෙස් මත කටයුතු කළ යුතුය.<br><br>• පාසල් ඇගයීම් කමිටුවෙන් ඇගයීම් පත්‍රිකා සඳහා ලකුණු ලබාදී සෑම ගුරුවරයෙකු විසින් ම ලබාගත් ලකුණු ලේඛනයක් සකස් කළ යුතුය. ලකුණු 50ට වැඩි සියලු ගුරුවරුන්ගේ ඇගයීම් පත්‍රිකා විදුහල්පති විසින් ජූනි 30 දිනට පෙර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යැවිය යුතුය.<br><br>• ලබා ගත් ලකුණු පිළිබඳව විදුහල්පති විසින් ගුරුවරුන් දැනුවත් කර, ඉතිරි ඇගයීම් පත්‍රිකා සුරක්ෂිතව තබා ගත යුතුය. |
| | |
| කලාප මට්ටම | • කලාප මට්ටමේ ගුරු ඇගයීම සඳහා නිළධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පත් කළ යුතුය.<br><br>• පාසල් මට්ටමෙන් තෝරා එවන ලද ගුරුවරුන්ගේ ඇගයීම් පත්‍රිකා පරීක්ෂා කර ගුරුවරුන් සම්මුඛ පරීක්ෂණයට ලක්කර ලේඛන හා තොරතුරුවල නිරවද්‍යතාව තහවුරු කිරීම <u>කලාප ඇගයීම් කමිටුව</u> විසින් සිදුකළ යුතුය.<br><br>• එමෙන්ම එම ගුරුවරුන් ඇගයීමට සුදුසු බව සහ විනය හා විමර්ශන චෝදනාවලට හෝ දඬුවම්වලට හෝ ලක් වී නොමැති බවට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පරීක්ෂා කර බලා තහවුරු කරගැනීමෙන් පසුව අදාළ නිර්දේශය ලබා දිය යුතුය<br><br>• සම්මුඛ පරීක්ෂණය අනුව ලකුණු 50ට වැඩි ගුරුවරුන්ගේ නාම ලේඛනය සහ ඇගයීම් පත්‍රිකා (ඇමුණුම 02 ට අනුව) ජූලි 31 දිනට පෙර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත භාරදිය යුතුය.<br><br>• ඉතිරි ඇගයීම් පත්‍රිකා හා අදාළ ලිපි ලේඛන අවශ්‍ය අවස්ථාවන්හි දී ඉදිරිපත් කිරීම සඳහා කලාප කාර්යාලයෙහි සුරක්ෂිතව තබා ගත යුතුය. |
| | |

| | |
|---|---|
| පළාත් හා ජාතික මට්ටම | • පළාත් සහ ජාතික මට්ටම ඒකාබද්ධ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් කලාප මට්ටමෙන් තෝරා එවන ලද ගුරුවරුන් සම්මුඛ පරීක්ෂණයකට ලක්කර ලේඛන හා තොරතුරුවල නිරවද්‍යතාව තහවුරු කරගත යුතුය.<br><br>• සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් තෝරා ගන්නා ගුරුවරුන් ඇගයීමට සුදුසු බව සහ විනය හා විමර්ශන චෝදනාවලට හෝ දඬුවම්වලට හෝ ලක් වී නොමැති බවට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද පරීක්ෂා කර බලා තහවුරු කරගැනීමෙන් පසුව නිර්දේශයක් ලබා දිය යුතුය.<br><br>• අසම්පූර්ණ අයදුම්පත් හා පාසල්/ කලාප/පළාත් මට්ටමෙන් සම්මුඛ පරීක්ෂණයට ලක් නොකළ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.<br><br>• එමෙන්ම සම්මුඛ පරීක්ෂණ මණ්ඩල වල සියලු සාමාජිකයින්ගේ අත්සන් රහිත අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ඇත.<br><br>• වැඩිම ලකුණු ලබා ගත් ගුරුභවතුන් අතරින් එක් පළාතකින් ගුරුභවතුන් 36 දෙනෙකු බැගින් අවසන් ඇගයීමට තෝරා ගැනීමෙන් පසුව ජාතික මට්ටමේ ඇගයීම් උලෙළක් පවත්වා ප්‍රණාම ලබා දීම සිදු කෙරේ. |
| | |

ඇමුණුම 01

### තෝරාගත් ගුරු නාම ලේඛනය

කලාපය.................................................

පාසල් වර්ගය (1AB/1C/2/3) ..................

| අංශය | ගුරුවරයාගේ නම | පාසලේ නම හා ලිපිනය | ජාතික හැඳුනුම්පත් අංකය | දුරකථන අංකය | ලබා ගත් ලකුණු | විශේෂ සටහන් |
|---|---|---|---|---|---|---|
| 1-5 | | | | | | |
| 6-9 | | | | | | |
| 10-11 | | | | | | |
| 12-13 | | | | | | |

එක් එක් පාසල් වර්ග අනුව තොරතුරු එවිය යුතුය

## 3. විදුහල්පතිවරුන් තෝරා ගැනීම

### 3.1 තෝරාගැනීම සඳහා මූලික සුදුසුකම්

- ඇගයීම් සිදු කරනු ලබන වර්ෂයට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවම වශයෙන් අඛණ්ඩව වසර 03ක් විදුහල්පති තනතුරේ රාජකාරි කටයුතු ඉටුකර තිබිය යුතුවේ

- විදුහල්පතිවරයෙකු වශයෙන් රාජකාරි ඉටු කිරීම සඳහා ලිඛිත වැඩ පැවරීමක් තිබිය යුතුය (ලිපියක් / ලොග් සටහනක්).
- ආයතන සංග්‍රහයට අනුව විනය හා විමර්ශන චෝදනාවලට හෝ දඩුවම්වලට හෝ ලක් වී නොතිබිය යුතුය

### 3.2 එක් පළාතකින් විදුහල්පතිවරුන් ප්‍රණාමලාභීන් ලෙස තෝරාගන්නා කාණ්ඩ හා සංඛ්‍යා

| පාසල් වර්ගය | ප්‍රණාම ලාභීන් සංඛ්‍යාව |
|---|---|
| 1AB පාසල් | **03** |
| 1C පාසල් | **03** |
| 2 පාසල් | **03** |
| 3 පාසල් | **03** |
| එකතුව | **12** |

### 3.3 සැලකිය යුතු කරුණු

- ✓ අයදුම් පත් ලැබුණු සියලුම විදුහල්පතිවරුන් විසින් ඇගයීම් පත්‍රිකාව (ආකෘතිය - B) අනුව අදාළ තොරතුරු සම්පූර්ණ කර ජූනි 15 දිනට පෙර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යැවිය යුතු ය.

- ✓ විශේෂයෙන් සඳහන් කර නොමැති අවස්ථාවල දී පෙර වර්ෂයේ 2018 ජනවාරි 01 වනදා සිට දෙසැම්බර් 31 වනදා දක්වා කාලය තුළ තොරතුරු ඇතුළත් කළ යුතුය

- ✓ ඉහත 3.1 හි සඳහන් පාසල් වර්ග නියෝජනය කරමින් වැඩිම ලකුණු ලබා ගත් ප්‍රණාමලාභීන් 12 දෙනා ජාතික මට්ටමින් ඇගයීමට ලක්කෙරෙන අතර ලකුණු අනුව තෝරා ගන්නා සෙසු ප්‍රණාමලාභින් පළාත් මට්ටමින් ඇගයීමට ලක් කෙරේ.

## 3.4 විදුහල්පතිවරුන් ප්‍රණාමලාභීන් ලෙස තෝරාගැනීමේ දී කලාප,පළාත් හා අමාත්‍යාංශ මට්ටමේ කාර්යභාරය

<table>
<tr><td>කලාප මට්ටම</td><td>

- සෑම කලාපයකම 2018 වර්ෂයෙහි පාසල් බාහිර ඇගයීම් ලකුණු සැලකිල්ලට ගෙන පහත වගු අංක 01 හි සඳහන් පරිදි එක් එක් පාසල් වර්ග අනුව ඉහළම අධ්‍යාපන ගුණාත්මක දර්ශකය ලබාගත් පාසල් 02 හි විදුහල්පතිවරුන් දෙදෙනාට අයදුම්පත (B ආකෘතිය ) ලබා දීම කලාප ගුරු ප්‍රතිභා සම්බන්ධීකරණ නිළධාරියා විසින් සිදු කළ යුතුවේ.
- 2018 වර්ෂයෙහි බාහිර ඇගයීමට ලක් නොකළ පාසල්වල පමණක් 2017 වර්ෂයෙහි අධ්‍යාපන ගුණාත්මක දර්ශකය සලකා බැලිය හැකිය.
- මෙහිදී පාසල් බාහිර ඇගයීමට අදාළ අධ්‍යාපන ගුණාත්මක දර්ශකය ගණනය කළ දින වන විට අදාළ පාසලෙහි වසරක කාලයක් විදුහල්පති වශයෙන් කටයුතු කර තිබිය යුතුවේ.
- ඉහත සුදුසුකම් සපුරන විදුහල්පතිවරයෙකු බාහිර ඇගයීම සිදු කළ දිනෙන් පසු ස්ථාන මාරු ලැබ වෙනත් පාසලක සේවය කරයි නම් පෙර පාසලට අදාළව අයදුම්පත ලබා දිය යුතුවේ.

වගු අංක 01

| 1AB | 1C | 2 වර්ගය | 3 වර්ගය |
|---|---|---|---|
| 02 | 02 | 02 | 02 |

- යම් පාසල් වර්ගයක අධ්‍යාපන ගුණාත්මක දර්ශකය 50 ට වැඩි පාසල් නොමැති නම් අයදුම්පත් ලබාදීම නොකළ යුතු වේ.
- තෝරා ගන්නා සියලු විදුහල්පතිවරුන් ඇගයීමට සුදුසු බව හා විනය හා විමර්ශන චෝදනාවලට හෝ දඬුවම්වලට හෝ ලක් වී නොමැති බවට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පරීක්ෂා කර බලා තහවුරු කරගැනීමෙන් පසුව අදාළ නිර්දේශ ලබා දිය යුතුවේ.
- නාම ලේඛනය සහ ඇගයීම් පත්‍රිකා (ඇමුණුම 02ට අනුව) ජුනි 30 දිනට පෙර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත භාරදිය යුතුය
- ඉතිරි ඇගයීම් පත්‍රිකා හා අදාළ ලිපි ලේඛන අවශ්‍ය අවස්ථාවන්හි දී ඉදිරිපත් කිරීම සඳහා කලාප කාර්යාලයෙහි සුරක්ෂිතව තබා ගත යුතුය

</td></tr>
<tr><td></td><td></td></tr>
<tr><td>පළාත් මට්ටම</td><td>

- පළාත් හා ජාතික මට්ටමේ ඒකාබද්ධ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ජාතික මට්ටම් සඳහා ප්‍රණාමලාභීන් තෝරාගනු ඇත.
- කලාප මට්ටමෙන් තෝරා එවන ලද විදුහල්පතිවරුන් සම්මුඛ පරීක්ෂණයට ලක්කර ලේඛන හා තොරතුරුවල නිරවද්‍යතාව තහවුරු කරගත යුතුය.
- අවශ්‍ය අවස්ථාවකදී ස්ථාන පරීක්ෂණයක් සිදු කළ හැකිය.

</td></tr>
</table>

| | |
|---|---|
| | • තෝරා ගන්නා විදුහල්පතිවරුන් ඇගයීමට සුදුසු බව සහ විනය හා විමර්ශන චෝදනාවලට හෝ දඬුවම්වලට හෝ ලක් වී නොමැති බවට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පරීක්ෂා කර බලා තහවුරු කරගැනීමෙන් පසුව අදාළ නිර්දේශය ලබා දිය යුතුය.<br>• අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.<br>• වැඩිම ලකුණු ලබා ගත් විදුහල්පතිවරුන් අතරින් එක් පළාතකින් 12 දෙනෙක් බැගින් අවසන් ඇගයීමට තෝරා ගැනීමෙන් පසුව ජාතික මට්ටමේ ඇගයීම් උලෙළේදී ප්‍රණාම ලබා දීම සිදු කෙරේ |
| | |

ඇමුණුම 03

තෝරාගත් විදුහල්පති නාම ලේඛනය

කලාපය..............................................

පාසල් වර්ගය (1AB/1C/2/3) ...............

| විදුහල්පතිවරයාගේ නම | පාසලේ නම හා ලිපිනය | ජාතික හැඳුනුම්පත් අංකය | දුරකථන අංකය | පාසල්අධ්‍යාපන ගුණාත්මක දර්ශකය | විශේෂ සටහන් |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

එක් එක් පාසල් වර්ග අනුව තොරතුරු එවිය යුතුය

ඉහත නම් සඳහන් ගුරුභවතුන්/ විදුහල්පතිවරුන් ආයතන සංග්‍රහය අනුව විනය කාර්ය පටිපාටියක දී පළමු උපලේඛනයේ වරද සම්බන්ධයෙන් විෂමාචාර චෝදනාවකට ලක්වී හෝ දඬුවම් ලබා නොමැති බවත් ප්‍රණාම ලැබීමට සුදුසු බවට නිර්දේශ කරමි.

.....................................   ...........................................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ අත්සන හා නිල මුද්‍රාව   පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය -